NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 19 ඒකකය

## සසුන සුරැකි සංගායනා

01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

1. ථේරවාදී ක්‍රමයට අනුගතව පැවැත්වූ සංගායනා ප්‍රමාණාත්මකව නිවැරදි වර්ණය වන්නේ,
   i. 07 කි   ii. 08 කි   iii. 05 කි   iv. 06 කි

2. ධර්ම සංගායනාවක් ලෙස හැඳින්විය හැකි වන්නේ,
   i. ධර්මය පිළිබඳ භික්ෂූන් රැස්ව සාකච්ඡා කිරීමයි
   ii. විනය පිළිබඳ භික්ෂූන් රැස්ව සාකච්ඡා කිරීමයි
   iii. විනය අභිධර්මය භික්ෂූන් රැස්ව සාකච්ඡා කිරීමයි
   iv. ධර්ම විනය, අභිධර්මය භික්ෂූන් රැස්ව සාකච්ඡා කිරීමයි

3. ත්‍රිපිටකාරූඪ ධර්ම සංගායනාව ලෙස සැළකෙන්නේ,
   i. පළමු ධර්ම සංගායනාවයි   iii. තුන්වන ධර්ම සංගායනාවයි
   ii. හතරවන ධර්ම සංගායනාවයි   iv. හයවන ධර්ම සංගායනාවයි

4. අභයගිරි වෙහෙර තනවා වළගම්බා රජු පූජා කළේ,
   i. සහදේව තෙරුන්ටය   iii. චුල්ලතිස්ස තෙරුන්ටය
   ii. මලියදේව තෙරුන්ටය   iv. කුපික්කලතිස්ස තෙරුන්ටය

5. මහා විහාර හා අභයගිරි විහාර භික්ෂූන් කණ්ඩායම් දෙකට බෙදී සිටියහ. එම කණ්ඩායම් දෙක වන්නේ,
   i. විදර්ශනා ධුරය හා ග්‍රන්ථ ධුරය ලෙසය   iii. ග්‍රාමවාසී හා නියම්ගම්වාසී ලෙසය
   ii. ආරණ්‍යවාසී හා වනවාසී ලෙසය   iv. ඉහත පිළිතුරු එකක්වත් නොවේ

6. පුස්තකාරූඪ ධර්ම සංගායනාවට මහරහතන් වහන්සේලා සහභාගි වූ ප්‍රමාණය නිවැරදි වර්ණය වනුයේ,
   i. 250 කි   ii. 350 කි   iii. 500 කි   iv. 600 කි

7. විදර්ශනා ධුර වැඩීම කරන භික්ෂූන් ලෙස සලකනු ලබන්නේ,
   i. පොත්පත් කට පාඩම් කරන තෙරවරුන්ය
   ii. සමාජ මෙහෙවර තුළ යෙදෙන තෙරවරුන්ය
   iii. භාවනානුයෝගීව සිටින තෙරවරුන්ය
   iv. භාවනානු හා සමාජ මෙහෙවර තුළ යෙදෙන තෙරවරුන්ය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

8. කණිෂ්ක රජු දායකත්වය දැක්වූ සංගායනාව හඳුන්වන නිවැරදි වර්ණය වන්නේ,
   i. පංචසතිකා සංගායනාව
   ii. සර්වාස්තිවාදි සංගායනාව
   iii. සාහස්සික සංගායනාව
   iv. පුස්තකාරූඪ සංගායනාව

9. පාර්ශව තෙරුන් හා වසුමිත්‍ර තෙරුන් ප්‍රධානත්වය දැරූ ධර්ම සංගායනාවේ දායකත්වය දැරූ රජු වන්යේ,
   i. කාලාශෝක රජු
   ii. ධර්මාශෝක රජු
   iii. කණිෂ්ක රජු
   iv. අජාසත්ත රජු

02. I. පුස්තකාරූඪ ධර්ම සංගායනාව පැවැත්වූයේ කිනම් ස්ථානයේදීද?
   II. එම පුස්තකාරූඪ ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කාරණය පැහැදිලි කරන්න.
   III. පුස්තකාරූඪ ධර්ම සංගායනාව නිසාවෙන් නිර්මල ථේරවාදී ත්‍රිපිටක බුද්ධ වචය ආරක්ෂා කිරීමේ ගෞරවය අද දක්වාම ශ්‍රී ලාංකික අපට හිමිවේ. පැහැදිලි කරන්න.

03. I. මහායානිකයන්ගේ හෙවත් සර්වාස්තිවාදීන්ගේ ධර්ම විනය ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගත් මාධ්‍ය නම් කරන්න.
   II. ථේරවාද ත්‍රිපිටකය මෙන්ම මහායාන ත්‍රිපිටකයක්ද රචිතය. එය සඳහන් කරන්න.
   III. කණිෂ්ක රජු ගේ අනුග්‍රහයෙන් පැවැත්වූ ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සිදුවූ අයුරු පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk